# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 ජනවාරි මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 ජනවාරි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : රු. 1.10 යි　　　　තැපැල් ගාස්තුව : ශත 75 යි

[සහතිකය සටහන් කළේ 1982 ජනවාරි මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 91/81.

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන පනතේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(අ) එම වගන්තියේ (ඉ) ඡේදය වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඉ) ආණ්ඩුව විසින් අනුමත කරන ලද යම් සංවර්ධන ව්‍යාපෘති හෝ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ සියලු ගිවිසුම් සහ සම්මුතිවලට ශ්‍රී ලංකාව ඇතුළත හෝ පිටත පිහිටි යම් තැනැත්තකු සමග කෙළින් ම හෝ නියෝජිතයකු මාර්ගයෙන් හෝ ඇතුළත් වීම, ඒවා ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම ; "; සහ

(ආ) එම වගන්තියේ (ජ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ජ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් නියෝජ්‍යායතනයක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ යම් සංවර්ධන ව්‍යාපෘති හෝ යෝජනා ක්‍රම, හෝ යම් සංවර්ධන කටයුතු අනුමත කිරීම, සම්බන්ධීකරණය කිරීම, විධිමත් කිරීම, පාලනය කිරීම හෝ තහනම් කිරීම ; ".

3. II වන කොටසට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි IIඅ කොටස ලෙස බලපැවැත්විය යුතු ය:— **ප්‍රධාන ප්‍රඥප්තියෙහි IIඅ අලුත් කොටස ඇතුළත් කිරීම.**

"IIඅ කොටස

සැලසුම් කිරීමේ කාර්ය පටිපාටිය

**සංවර්ධන සැලසුම් පිළියෙළ කිරීම.** 8අ. (1) සංවර්ධන ප්‍රදේශයක හෝ එහි කොටසක, ඉඩම් සහ ගොඩනැගිලි පිළිබඳ ව ඒකාබද්ධ වූ සැලසුම් කිරීම සහ භෞතික වශයෙන් සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කිරීමේ හා විධිමත් කිරීමේ අදහස ඇතිව අධිකාරිය විසින්, ප්‍රජාව වෙත සලසා දෙනු ලබන පහසුකම් සහ සේවාවන් ගැන සැලකිලිමත් වෙමින් සංවර්ධන ප්‍රදේශය හෝ එහි කොටසක් සඳහා සංවර්ධන සැලැස්මක් පිළියෙළ කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල වල ව්‍යාප්තියට හානියක් නොමැති ව, මේ පනතේ උපලේඛනයේ විධිවිධාන සලසා ඇති කරුණු සියල්ල ම හෝ ඉන් කිසිවක් හෝ සම්බන්ධයෙන් විධිවිධාන, සංවර්ධන සැලැස්මක් අඩංගු විය හැකි ය.

**සැලසුම් කිරීමේ කමිටු පත් කිරීම.**

8ආ. (1) සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීමට, ක්‍රියාවේ යෙදවීමට සහ බලාත්මක කිරීමට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් අධිකාරියට උපදෙස් දීමේ කාර්යය සඳහා මෙහි මින් මතු "සැලසුම් කිරීමේ කමිටු" යනුවෙන් සඳහන් කරනු ලබන කමිටුවක්, නියම කරනු ලබන ප්‍රකාර පත් කරනු ලැබිය යුතු ය.

(2) සැලසුම් කිරීමේ කමිටුව විසින් කටයුතු කරගෙන යාම සඳහා රීති සාදනු ලැබිය හැකි ය.

**සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයිය යුතු බව නියම කිරීමට අධිකාරියට ඇති බලය.**

8ඇ. (1) සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීම සඳහා අධිකාරිය විසින්, එම සංවර්ධන ප්‍රදේශයෙහි හෝ එහි කොටසෙහි පරිපාලන සීමාව තුළ පිහිටා ඇති පළාත් පාලන ආයතනයට හෝ පළාත් පාලන ආයතනවලට හෝ එම ප්‍රදේශයෙහි යම් තැනැත්තකුට ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන්, ඒ දැන්වීමෙහි සඳහන් කාලසීමාව තුළ දී—

(අ) අධිකාරියේ මතයට අනුව අවශ්‍ය ලෙස සලකන්නා වූ ද දැන්වීමෙහි සඳහන් කරනු ලබන්නා වූ ද තොරතුරු සපයන ලෙස ;

(ආ) එම පළාත් පාලන ආයතනය හෝ පළාත් පාලන ආයතන හෝ ඒ තැනැත්තා හෝ විසින් ප්‍රයෝජනවත් යයි සලකනු ලබන නිර්දේශ කිසිවක් වේ නම්, ඒ නිර්දේශ ඉදිරිපත් කරන ලෙස

සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීමේ දී නියම කරනු ලැබිය හැකි ය.

(2) යම් නීතියක විධිවිධාන යටතේ එම තොරතුරු සැපයීමෙන් පළාත් පාලන ආයතන හෝ තැනැත්තා හෝ වළක්වනු ලැබ ඇති අවස්ථාවක හැර, එම දැන්වීමෙහි සඳහන් කර ඇති කාලසීමාව තුළ දී එහි නියමයන් අනුව කටයුතු කිරීම (1) වන උපවගන්තිය මගින් දැන්වීමක් මගින් යම් තොරතුරු සපයන ලෙස නියම කරනු ලැබ සිටින පළාත් පාලන ආයතනයක හෝ යම් තැනැත්තකුගේ හෝ කාර්ය විය යුතු ය.

**කෙටුම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම.**

8ඈ. කෙටුම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙළ කරනු ලැබූ විට, අධිකාරිය විසින්, ඒ සැලැස්මේ පිටපතක්, පිළියෙළ කරන ලද එම සැලැස්ම අදාළ වන සංවර්ධන ප්‍රදේශයෙහි හෝ එහි කොටසෙහි පරිපාලන සීමා තුළ පිහිටි පළාත් පාලන ආයතනය හෝ ආයතන වෙත එම පළාත් පාලන ආයතනයෙහි

හෝ ආයතනවල නිරීක්ෂණ සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම ගෙවුම්පත් සැලැස්ම ලැබී දින හැටක් ඇතුළත දී, ඒ පිළිබඳව එම පළාත් පාලන ආයතනයේ හෝ ආයතනවල නිරීක්ෂණ කිසිවක් වේ නම් ඒ නිරීක්ෂණ අධිකාරිය වෙත ඉදිරිපත් කිරීම ඒ පළාත් පාලන ආයතනයේ හෝ ආයතනවල කාර්ය විය යුතු ය.

ගෙවුම්පත් සංවර්ධන සැලැස්ම සැලසුම් කිරීමේ කමිටුව විසින් පරීක්ෂා කොට අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු බව.

8ඉ. (1) 8ඈ වන වගන්තියෙහි සඳහන් දින හැටක කාලසීමාව ඉකුත් වූ විට, ගෙවුම්පත් සැලැස්ම, ඒ වගන්තිය යටතේ ලැබුණු නිරීක්ෂණ කිසිවක් වේ නම් ඒවා ද සමග සැලසුම් කිරීමේ කමිටුව විසින් පරීක්ෂා කරනු ලැබිය යුතු අතර, ඒ පරීක්ෂණයෙන් පසු හැකි පමණ ඉක්මනින් සැලසුම් කිරීමේ කමිටුව විසින් එම සංවර්ධන සැලැස්ම, ඒ පිළිබඳ එහි නිර්දේශයක් ද සමග අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ගෙවුම්පත් සංවර්ධන සැලැස්ම අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබූ විට, අධිකාරිය විසින්, ඒ සංවර්ධන සැලැස්ම, ඒ පිළිබඳ එහි නිර්දේශ ද සමග එය අනුමත කරනු ලැබීම හෝ වෙනස් කරනු ලැබීම සඳහා අමාත්‍ය වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

සංවර්ධන සැලැස්ම අනුමත කිරීම.

8ඊ. 8ඉ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ගෙවුම්පත් සංවර්ධන සැලැස්ම අධිකාරිය විසින් එවනු ලැබූ විට, එම සැලැස්ම සම්බන්ධයෙන් අධිකාරියේ මෙන්ම කමිටුවේ ද නිර්දේශ සලකා බැලීමෙන් පසුව අමාත්‍යවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන වෙනස් කිරීම් හෝ මඳ වශයෙන් වෙනස් කිරීම් හෝ කිසිවක් වේ නම්, ඒවාට යටත් ව, සංවර්ධන සැලැස්ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි ය.

සංවර්ධන සැලැස්ම අනුමත කිරීම යනාදිය පිළිබඳ දැන්වීම.

8උ. අමාත්‍යවරයා විසින් යම් ගෙවුම්පත් සංවර්ධන සැලැස්මක් අනුමත කරනු ලැබූ අවස්ථාවක, ඒ අනුමත කිරීමෙන් පසුව හැකි පමණ ඉක්මනින්—

(අ) සංවර්ධන සැලැස්ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇති බවට සහ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි එය ක්‍රියාත්මක වන බවට දැන්වීමක් ගැසට් පත්‍රයෙහි සහ සංවර්ධන ප්‍රදේශයෙහි හෝ ඉන් කොටසක සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා ප්‍රවෘත්ති පත්‍රයක පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය ; තවද

(ආ) කොළඹ පිහිටි අධිකාරියෙහි ප්‍රධාන කාර්යාලයේ හෝ අධිකාරියේ වෙනත් කාර්යාලවල හෝ සංවර්ධන සැලැස්ම අදාළ වන සංවර්ධන ප්‍රදේශයේ හෝ ඉන් කොටසක නැතහොත් ඒ අසල පිහිටා ඇති පළාත් පාලන ආයතන කාර්යාලයේ හෝ පළාත් පාලන ආයතන කාර්යාලවල හෝ මහජනයා විසින් පරීක්ෂා කර බැලීම සඳහා සංවර්ධන සැලැස්ම සමග ලිඛිත ප්‍රකාශය, සැලසුම්, පිඹුරු සහ එහි ඇමුණුම් ලබා ගැනීමට සැලැස්විය යුතු ය.

සංවර්ධන සැලැස්ම සංශෝධනය කිරීම යනාදිය.

8ඌ. (1) සංවර්ධන ප්‍රදේශයක හෝ ඉන් කොටසක සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමෙන් පසු යම් අවස්ථාවක අධිකාරිය විසින්, සංවර්ධන සැලැස්මෙහි දක්වා ඇති පහසුකම් සහ සේවාවන් සැලකිල්ලට ගෙන සංවර්ධන සැලැස්මෙහි සංශෝධනය, ප්‍රතියෝජනය, ප්‍රතිශෝධන හෝ මඳ වශයෙන් වෙනස් කිරීම අවශ්‍ය හෝ යෝග්‍ය වන අවස්ථාවක, සංවර්ධන ප්‍රදේශයෙහි හෝ ඉන් කොටසක යම් විශේෂ කොටසකට හෝ කොටස්වලට සංවර්ධන සැලැස්ම අදාළ වනතාක් දුරට, එය සංශෝධනය කිරීම, ප්‍රතියෝජනය කිරීම, ප්‍රතිශෝධනය කිරීම හෝ මඳ වශයෙන් වෙනස් කිරීම අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් සංවර්ධන සැලැස්මක සංශෝධනය, ප්‍රතියෝජනය, ප්‍රතිශෝධනය හෝ මඳ වශයෙන් වෙනස් කිරීම සම්බන්ධයෙන් 8ඇ, 8ඈ, 8ඉ, 8ඊ සහ 8උ වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම සහිතව, අදාළ විය යුතු ය.

සංවර්ධන ප්‍රදේශවල සංවර්ධන කටයුතු කරගෙන යාම හෝ සංවර්ධන කටයුතුවල නිරතවීම සඳහා අවසර පත්‍ර.

8එ. (1) වෙනත් යම් නීතියක විධිවිධාන කෙසේ වුව ද යම් සංවර්ධන ප්‍රදේශයක හෝ එහි කොටසක යම් සංවර්ධන කටයුතු කරගෙන යාම හෝ සංවර්ධන කටයුතුවල නිරතවීම, ආණ්ඩුවේ නියෝජ්‍යායතනයක් ඇතුළු කිසිම තැනැත්තකු විසින්, අධිකාරිය විසින් එහි ලා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය යටතේ හැර, කරනු නොලැබිය යුතු ය.

(2) සංවර්ධන ප්‍රදේශයක හෝ ඉන් කොටසක සංවර්ධන කටයුතු කරගෙන යාම හෝ සංවර්ධන කටයුතුවල නිරතවීම හෝ සඳහා ඉල්ලුම්පතක් මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කරනු ලබන ආකෘති පත්‍රයක විය යුතු අතර, එසේ නියම කරනු ලබන තොරතුරු එහි අඩංගු විය යුතු ය. තව ද එසේ නියම කරනු ලබන ගාස්තු ද ඒ සමඟ විය යුතු ය.

(3) (අ) සංවර්ධන සැලැස්ම අනුමතය සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති හෝ සංවර්ධන සැලැස්ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇති යම් විටක ක්‍රියාත්මක කිරීමට හෝ නිරතවීමට අපේක්ෂිත සංවර්ධන කටයුත්ත ඒ සංවර්ධන සැලැස්මෙහි යම් යෝජනාවකට හෝ විධිවිධානයකට අනනුකූල නැතහොත් පටහැනි නොවන බවට ; සහ

(ආ) කිසිදු සංවර්ධන සැලැස්මක් පිළියෙළ කරනු නොලැබූ යම් විටක, ඒ සංවර්ධන කටයුත්ත ක්‍රියාත්මක කිරීම හෝ සංවර්ධන කටයුත්තෙහි නිරතවීම සඳහා අවසර පත්‍රයක් අවශ්‍ය වන්නේ යම් කාර්යයක් සඳහා ද, ඒ කාර්ය ඒ ප්‍රදේශයේ අනාගත සංවර්ධනයෙහි ලා අනුකූල වනු බවට

අධිකාරිය සෑහීමට පත් වේ නම් (1) වන උපවගන්තිය යටතේ අවසර පත්‍රයක්, අධිකාරිය අවශ්‍ය යයි සලකනු ලබන ඒ කොන්දේසිවලට යටත් ව, අධිකාරිය විසින් ඒ උපවගන්තිය යටතේ ප්‍රදානය කරනු ලැබිය හැකිය.

(4) මේ වගන්තිය යටතේ අවසර පත්‍රයක් ප්‍රදානය කිරීමේ දී හෝ නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමේ දී අධිකාරිය විසින් කමිටුවේ නිර්දේශ සැලකිල්ලට ගනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය යටතේ අවසර පත්‍රයක් ප්‍රදානය කිරීමට අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ සාදන ලද නියෝගවලට යටත්ව, ඒ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනය කරනු ලැබිය හැකි අතර, එවැනි අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක වන්නේ ය.

(6) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් අවුරුදු එකක කාලසීමාවක් සඳහා වලංගු වන්නේ ය:

එසේ වුව ද අවසර පත්‍රයෙහි සඳහන් සංවර්ධන කටයුත්ත ආරම්භ කරනු ලැබ ඇති නමුත් අනපේක්ෂිත අවස්ථානුගත කරුණු නිසා අවසන් කර නොමැති බවට අධිකාරිය සෑහීමට පත් වේ නම්, ඉල්ලීමක් කිරීම මත, අධිකාරිය විසින්, අවසර පත්‍රයෙහි වලංගු කාලය අවුරුදු දෙකක් නොඉක්මවන වැඩිදුර කාල සීමාවක් හෝ කාලසීමා හෝ සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය :

එසේ ම කවදුරටත් අවසර පත්‍රයක කාලය අවසන් වීමේ හේතුවෙන් එම කාර්ය සඳහා යම් තදනන්තර ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම වළක්වනු නො ලැබිය යුතු ය.

සංවර්ධන කටයුතු අවසර පත්‍රය නියමයට අනුකූල විය යුතු බව.

8ඒ. (1) සංවර්ධන කටයුතු සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයකට පටහැනි ලෙස හෝ ඊට වෙනස් වන ලෙස, කිසිදු සංවර්ධන කටයුත්තක් ක්‍රියාත්මක කිරීම හෝ සංවර්ධන කටයුත්තක නිරතවීම හෝ කරනු නොලැබිය යුතු ය.

(2) යම් සංවර්ධන කටයුත්තක් සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය යටතේ යම් සංවර්ධන කටයුත්තක් යම් තැනැත්තකු විසින් සම්පූර්ණ කරනු ලැබූ විට, ක්‍රියාත්මක කරන ලද හෝ නිරතව සිටි සංවර්ධන කටයුත්ත, ඒ සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයට අනුකූලව කරන ලද බවට අධිකාරිය වෙතින් සහතිකයක් ඉල්ලුම්කර, ලබා ගැනීම එම තැනැත්තාගේ කාර්යය වන්නේය.

(3) (2) වන උපවගන්තිය යටතේ අනුකූලතා සහතිකයක් ලැබුණු විට, කිසිදු ඉඩමක් හෝ ගොඩ නැඟිල්ලක්, ඒ සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයෙහි සඳහන් කාර්ය නොවන වෙනත් යම් කාර්ය සඳහා පාවිච්චි කරනු නොලැබිය යුතු ය.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි "ප්‍රකාශයෙන් පසු ඒ ඉඩමට කරන ලද යම් වැඩි දියුණු කිරීම් වේ නම්, ඒ වෙනුවෙන් සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කළ, ඒ දිනයේ " යන වචන වෙනුවට, පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" දිනයෙහි ඒ වෙළෙඳ වටිනාකම සහ—

(අ) ඉඩම අත්කර ගැනීමේ පනතේ 38 වන වගන්තියේ විධිවිධාන යටතේ නියමයක් කරනු ලැබ නොමැති කිසියම් ඉඩමක් හෝ ඒ ඉඩම පිළිබඳව වූ සම්බන්ධතාවක් හෝ සම්බන්ධයෙන් වන විට, ඒ පනතේ 7 වන වගන්තිය යටතේ දැන්වීම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි ඉඩමේ හෝ එහි සම්බන්ධතාවේ වෙළෙඳ වටිනාකම ; නැතහොත්

(ආ) ඉඩම අත්කර ගැනීමේ පනතේ 38 වන වගන්තියේ විධිවිධාන යටතේ නියමයක් කරනු ලැබ ඇති ඉඩමක් හෝ ඒ ඉඩම පිළිබඳව වූ සම්බන්ධතාවක් හෝ සම්බන්ධයෙන් වන විට එම නියමය පළ කරන ලද දිනයෙහි එම ඉඩමේ හෝ එහි සම්බන්ධතාවේ වෙළෙඳ වටිනාකම

අතර වෙනසෙහි සියයට පණහකින් වැඩි වූ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "සංවර්ධන ව්‍යාපෘතියක්" යන වචන වෙනුවට, "සංවර්ධන සැලැස්ම හෝ සංවර්ධන යෝජනා ක්‍රමය" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ (4) වන උපවගන්තියෙහි " හෝ කටයුත්තක් කිරීම අධිකාරිය හැර වෙනත් කිසිම තැනැත්තකු " යන වචන වෙනුවට " හෝ කටයුත්තක් කිරීම (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, අධිකාරිය හැර වෙනත් කිසිම තැනැත්තකු " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(5) 3 වන වගන්තිය යටතේ සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශිත යම් ප්‍රදේශයක් ඇතුළත සැලසුම් කිරීමට අදාළ අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් අධිකාරිය විසින් පළාත් පාලන ආයතනයක් විමසා ඒ පළාත් පාලන ආයතනයෙහි යම් නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි අතර, එම නිලධරයා විසින්, අධිකාරියෙහි විධානය, අධීක්ෂණය සහ පාලනය යටතේ එසේ පවරන ලද බලතල ක්‍රියාවේ යෙදවීම, කාර්ය ඉටු කිරීම සහ කර්තව්‍ය කිරීම කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 26අ සහ 26ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

6. 26 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියෙහි 26අ සහ 26ආ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :—

අධිකාරිය විසින් බලතල යනාදිය පැවරීම.

26අ. මේ පනත යටතේ අධිකාරියෙහි බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් අධිකාරිය විසින්, අධිකාරියෙහි සභාපතිවරයා වෙත හෝ යම් නිලධරයකු වෙත හෝ පවරනු ලැබිය හැකි ය.

දඩ මුදල් අයකර ගනු ලැබූ විට, අධිකාරියෙහි අරමුදලට බැර කළ යුතු බව.

26ආ. මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ යම් වරදක් සඳහා නියම කරන ලද සියලු දඩ මුදල් අය කරනු ලැබූ විට, ඒවා අධිකාරියේ අරමුදල වෙත බැර කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

වැරදි සහ දණ්ඩන.

"28. (1) මේ පනතෙහි යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක්, රීතියක් හෝ නියමයක් හෝ කරන ලද විධානයක් හෝ නියමයක් කඩ කරන නැතහොත් ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාර යෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තකුම මේ වගන්තිය යටතේ නියම කරන ලද දඩයකට අතිරේකව, වරදකරු කිරීමෙන් පසුව වරද කර ගෙන යන්නා වූ එක් එක් දිනය සඳහා රුපියල් එක්දහසක දඩයකට ද යටත් විය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 28අ, 28ආ, සහ 28ඇ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

8. 28 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 28අ වගන්තිය, 28ආ වගන්තිය සහ 28ඇ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු යි :—

'' අවසර පත්‍රයෙහි නියම සහ කොන්දේසිවලට පටහැනිව ආරම්භ කරන ලද ඇතැම් සංවර්ධන කටයුතු යනාදිය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

28අ. (1) යම් සංවර්ධන පුද්ගලයක යම් සංවර්ධන කටයුත්තක් අවසර පත්‍රයක් නොමැතිව හෝ එම සංවර්ධන කටයුත්ත වෙනුවෙන් නිකුත් කරන ලද අවසර පත්‍රයෙහි දක්වා ඇති යම් නියම හෝ කොන්දේසිවලට පටහැනිව ආරම්භ කරන, පවත්වා ගෙන යන, නැවත ආරම්භ කරන හෝ සම්පූර්ණ කරන අවස්ථාවක, මේ පනත් යටතේ අධිකාරිය සතු වෙනත් යම් ප්‍රතිකර්මයකට අතිරේකව, එම සංවර්ධන කටයුත්ත කරගෙන යන්නා වූ හෝ කරගෙන ගිය හෝ කරගෙන යාමට සැලැස් වූ තැනැත්තා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන්, එම දැන්වීමේ දින සිට දින හතක්ට පෙර නොවන දිනයක් විය යුතු, එම දැන්වීමෙහි සඳහන් දිනයක හෝ ඒ දිනයට පෙර—

(අ) ඒ සංවර්ධන කටයුත්ත නොපමාව ම නතර කරන ලෙස ;

(ආ) එම සංවර්ධන කටයුත්ත කරගෙන යන්නා වූ හෝ කරගෙන ගිය ඉඩමෙහි මුලින් තිබුණ තත්ත්වයට නැවත පත් කරන ලෙස ; හෝ

(ඇ) එම සංවර්ධන කටයුත්ත කරගෙන යනු ලබන්නේ හෝ සංවර්ධන කටයුත්තෙහි නිරතව සිටින්නේ යම් අවසර පත්‍රයක බලය යටතේ ද ඒ අවසර පත්‍රයට හෝ ඒ අවසර පත්‍රයේ යම් නියමයකට හෝ කොන්දේසිය කට හෝ අනුව කටයුතු කරන ලෙස

අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි අතර, ඉහත සඳහන් නියමයන් අනුව කටයුතු කිරීමේ කාර්ය සඳහා —

(i) යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් පාවිච්චි කිරීම අවසන් කිරීම ; හෝ

(ii) යම් ගොඩනැගිල්ලක් හෝ කර්මාන්තයක් කඩා දැමීම හෝ වෙනස් කිරීම

අධිකාරිය විසින් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කරනු ලැබූ තැනැත්තකු විසින් ඒ දැන්වීමෙහි සඳහන් කාලසීමාව ඇතුළත දී හෝ කාලය දීර්ඝ කිරීම සඳහා කරනු ලැබූ ඉල්ලීමක් මත, අධිකාරිය විසින් දීර්ඝ කරන ලද යම් කාලසීමාවක් ඇතුළත දී ඒ දැන්වීමෙහි සඳහන් යම් නියම අනුව ක්‍රියා කිරීම ඔහුගේ කාර්යය විය යුතු ය.

(3) (අ) ඉහත (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක ප්‍රකාර ඒ දැන්වීමෙහි සඳහන් කාලසීමාව ඇතුළත හෝ අධිකාරිය විසින් දීර්ඝ කරන ලද කාලසීමාව ඇතුළත හෝ යම් ගොඩනැගිල්ලක් හෝ කර්මාන්තයක් කඩා නොදමන හෝ වෙනස් කරනු නොලබන අවස්ථාවක, එම ගොඩනැගිල්ල හෝ කර්මාන්තය කඩා දැමීමට හෝ වෙනස් කිරීමට අධිකාරියට බලය දෙමින් අධිකරණ නියෝගයක් කරන ලෙස අධිකාරිය විසින් මහෙස්ත්‍රාත්වරයාගෙන් ඉල්ලා සිටිය හැකි අතර, මහෙස්ත්‍රාත්වරයා විසින්, එම ගොඩනැගිල්ල හෝ කර්මාන්තය කඩා දමන ලෙස හෝ වෙනස් කරන ලෙස (1) වන උපවගන්තිය යටතේ අධිකාරියේ නියමය අනුව ක්‍රියා කිරීම පැහැර හරින ලද තැනැත්තා වෙත දැන්වීමක් භාරදී ඒ පිළිබඳව සෑහීමකට පත් වූවහොත්, ඒ අනුව ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(ආ) ගොඩනැගිල්ල හෝ කර්මාන්තය කඩා දැමීමට හෝ වෙනස් කිරීමට එම තැනැත්තා පොරොන්දු වන්නේ නම්, එසේ කිරීම යෝග්‍ය යයි මහෙස්ත්‍රාත්වරයා කල්පනා කරතහොත් ඒ ගොඩනැගිල්ල හෝ කර්මාන්තය කඩා දැමීමට හෝ වෙනස් කිරීමට ඒ තැනැත්තාට අවස්ථාවක් සලසා දීමේ කාර්යය සඳහා ප්‍රමාණවත් යයි මහෙස්ත්‍රාත්වරයා විසින් සලකනු ලබන, මාස දෙකක් නොඉක්ම වන කාලසීමාවක් සඳහා, එම ආඥාව ක්‍රියාත්මක වීම මහෙස්ත්‍රාත්වරයා විසින් කල් දමනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ අධිකරණ ආඥාවක් කරනු ලැබ ඇති අවස්ථාවක, එම ආඥාව ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය සියලු සහාය අධිකාරිය වෙත දීම පොලිසියේ කාර්යය විය යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා විසින් කරන ලද ආඥාවක් ප්‍රකාර යම් ගොඩනැගිල්ලක් හෝ කර්මාන්තයක් කඩා දැමීමේ දී හෝ වෙනස් කිරීමේ දී අධිකාරිය විසින් දරන ලද යම් සාධාරණ වියදමක් අයකර ගැනීමේ හිමිකම අධිකාරියට තිබිය යුතු ය.

**ඇතැම් අවස්ථාවල දී ඉඩම සතුකර ගැනීම.**

28ආ. (1) යම් තැනැත්තකු, —

(අ) 8ඊ (1) වන වගන්තියේ යම් විධිවිධානයක් කඩ කර තිබීම නිසා 28 වන වගන්තිය යටතේ වරදකරු කරනු ලැබ ඇත්තා වූ ද ;

(ආ) 28අ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කරනු ලැබ තිබිය දී ඒ දැන්වීමෙහි යම් නියම අනුව ක්‍රියා නොකොට නොමැත්තා වූ ද,

කවර හෝ විටෙක, අධිකාරිය විසින් ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කරනු ලැබ, ඉඩම හෝ ගොඩනැගිල්ල, පවත්නා තත්ත්වයෙන් යම් කාර්යයක් සඳහා අධිකාරිය විසින් ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි බවට අමාත්‍යවරයා සෑහීමට පත් වූ විට, ඔහු විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මඟින්, ඒ නියමයෙහි සඳහන් කරනු ලැබිය යුතු දිනයක සිට, එම ඉඩම අධිකාරිය වෙත සතු කරනු ලැබිය හැකි ය.

(2) යම් ඉඩමක් (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය වෙත සතු කරනු ලැබ ඇති අවස්ථාවක—

(අ) එම ඉඩමෙහි යම් සංවර්ධන කටයුතු කර ගෙන යාම සඳහා 8ඊ වගන්තිය යටතේ අවසර පත්‍රයක් ලබා ගෙන නොමැති අවස්ථාවක, එවැනි යම් සංවර්ධන කටයුත්තක් වෙනුවෙන් කිසිදු වන්දියක් ලැබීමට කිසිම තැනැත්තකුට හිමිකමක් නොතිබිය යුතු ය.

(ආ) ඒ ඉඩමෙහි සංවර්ධන කටයුතු කිසිවක් කරගෙන යාම සඳහා 8ඊ වගන්තිය යටතේ අවසර පත්‍රයක් ලබාගෙන ඇති අවස්ථාවක, එම අවසර පත්‍රයෙහි දක්වා ඇති නියම හා කොන්දේසි අනුව කර ගෙන ගොස් ඇති වැඩ ප්‍රමාණයට හැර, එම සංවර්ධන කටයුත්ත වෙනුවෙන් කිසිදු වන්දියක් ලැබීමට කිසිම තැනැත්තකුට හිමිකමක් නො තිබිය යුතු ය.

**පුද්ගල මණ්ඩල යනාදිය විසින් කරනු ලබන වැරදි.**

28ඇ. මේ පනත යටතේ වූ වරදක්—

(අ) පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන අවස්ථාවක—

(i) ඒ මණ්ඩලය (රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් නොවන) සංස්ථාගත මණ්ඩලයක් නම්, වරද කරන ලද අවස්ථාවේ ඒ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු ව හෝ ලේකම්වරයකු හෝ වෙනත් සමාන නිලධරයකු ව සිටි සෑම තැනැත්තකු ම ; හෝ

(ii) ඒ මණ්ඩලය රාජ්‍ය සංස්ථාවක් නම්, එහි සභාපතිවරයා හෝ සභාපතිවරයකු නොසිටින අවස්ථාවක, එහි ප්‍රධාන විධායක නිලධරයා ; හෝ

(iii) ඒ මණ්ඩලය පළාත් පාලන ආයතනයක් නම් එය සංවර්ධන සභාවක් වන අවස්ථාවක, එහි දිසා ලේකම්වරයා හෝ එය මහ නගර සභාවක් හෝ නගර සභාවක් වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, නගරාධිපතිවරයා හෝ සභාපතිවරයා ; හෝ

(iv) ඒ මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නොවේ නම්, වරද කරන ලද අවස්ථාවේ ඒ මණ්ඩලයෙහි සාමාජිකයකුව හෝ හවුල්කරුවකුව හෝ එහි ප්‍රධාන විධායක නිලධරයාව සිටි සෑම තැනැත්තකු ම ; හෝ

(ආ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් විසින් කරනු ලබන අවස්ථාවක, ඒ වරද කරනු ලැබුවේ යම් සංවර්ධන කටයුත්තක් සම්බන්ධයෙන් ද ඒ සංවර්ධන කටයුත්ත ක්‍රියාත්මක කිරීමෙහි ලා හෝ ක්‍රියාත්මක කිරීමට සැලැස්වීමෙහි ලා වගකිව යුතු, එම දෙපාර්තමේන්තුවේ නිලධරයා

ස්වකීය කැමැත්ත හෝ අනුදැනීම හෝ නොමැතිව ඒ වරද කරන ලද බව ස්වකීය කර්තව්‍යයෙහි ස්වභාවය සහ සියලු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන, ඒ වරද කිරීම වැළැක්වීම පිණිස තිබූ සියලු උද්‍යෝගයන් තමා ක්‍රියා කළ බව ද ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වරද කිරීම සම්බන්ධයෙන් ඔහු වගකිව යුතු ය.''.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) '' පළාත් පාලන ආයතනය '' යන අර්ථ කථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථ කථන ඇතුළත් කිරීමෙන් :—

''' සංවර්ධන කටයුත්ත '' යන්නෙන්, යම් ඉඩමක් කොටස් කිරීම හෝ අනු කොටස්වලට බෙදීම, ඒ මත ඉදිකිරීම් තැනීම හෝ නැවත තැනීම සහ කර්මාන්ත ඉදි කිරීම, එම ඉඩමෙහි, ඉඩම මත හෝ ඉඩම යට ගොඩනැගිලි, ඉංජිනේරු සහ වෙනත් මෙහෙයුම් කර ගෙන යාම, එම ඉඩම හෝ එහි යම් ඉදි කිරීමක් පාවිච්චි කරනු ලබන්නේ, කෘෂිකර්මයේ සහ උද්‍යාන විද්‍යාවේ කාර්ය සඳහා යම් ඉඩමක් යොදා ගැනීම සහ පදිංචි නිවාසයක සීමාව ඇතුළත යම් ඉඩම් ප්‍රමාණයක් එහි පදිංචි නිවාසය භුක්ති විඳී ම ආනුෂංගික වන්නා වූ ද අලුත් ගොඩනැගි

සැලැස්මක් ඉදිරිපත් කිරීම හෝ ඒ පදිංචි නිවාසය වෙනුවෙන් දැනටමත් අනුමත කර ඇති ගොඩනැගිලි සැලැස්මක් වෙනස් කිරීම හෝ අදාළ වන්නා වූ ද කාර්ය සඳහා යොදා ගැනීමක් නොවන යම් කාර්යයක් සඳහා ද ඒ කාර්යයෙහි වෙනසක් කිරීම, අදහස් වේ ;

" ආණ්ඩුවේ නියෝජ්‍යායතනය" යන්නෙන්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්, පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය සංස්ථාවක් අදහස් වේ ;' ;

(ආ) " පළාත් පාලන ආයතනය " යන අර්ථ කථනයෙහි " මහා නගර සභාවක් " යන වචන වෙනුවට, " යම් සංවර්ධන සභාවක්, මහා නගර සභාවක් " යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) " ගොඩනැගිලි සැලසුම් කිරීම " යන අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'" රාජ්‍ය සංස්ථාව " යන්නෙන්, සමාගම් ආඥාපනත යටතේ හැර, වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්ද වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලින් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ.'.

ප්‍රධාන ප්‍රඥප්තියට උපලේඛනය එකතු කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපලේඛනය එකතු කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" උපලේඛනය

සංවර්ධන සැලැස්මෙහි විධිවිධාන සලස්වනු ලැබිය හැකි කාරණා

1. සංවර්ධන ප්‍රදේශයෙහි ඉඩම් සහ ගොඩනැගිලි පාවිච්චි කරනු ලැබිය හැකි ආකාරය.

2. විවිධ කාර්ය සඳහා ඉඩම් කොටස්වලට බෙදීම, වෙන් කිරීම හෝ කුලාපගත කිරීම.

3. විවිධ කලාපවල ඉඩම් සහ ගොඩනැගිලි පදිංචියට ගැනීම, වාණිජ කටයුතු, කර්මාන්ත යනාදී වශයෙන් ප්‍රයෝජනයට ගැනීම විධිමත් කිරීම සඳහා ද බිම් ප්‍රමාණ අනුපාතය, ඝනත්වය, පිහිටීමේ උස, මහල් සංඛ්‍යාව සහ ගොඩනැගිලි සහ ඉදි කිරීම්වල ප්‍රමාණය, බිම් කට්ටිවල ප්‍රමාණය, අංගන සහ විවෘත ඉඩකඩ, වීදිවල සිට ඈත් විය යුතු දුර, ගොඩනැගිලි සීමා සහ ගොඩනැගිලි, ඉදි කිරීම් සහ යාබද ඉඩම් පාලනය කිරීම සහ නඩත්තු කිරීම සම්බන්ධයෙන් කොන්දේසි සහ සීමා පැනවීම.

4. ගොඩනැගිලි සම්බන්ධයෙන්—

(අ) ගොඩනැගිලිවල විවිධ කොටස්වල ශක්තිය, අළුත්වැඩියා කිරීම සහ ප්‍රතිව්‍යූහය;

(ආ) ප්‍රමාණය සහ උස, භූමියෙහි මට්ටම, කාමර සහ පහසුකම් පිළිබඳ ප්‍රමිති, තරප්පු පේළි සහ පිටමංවල පිහිටීම සහ ප්‍රමිති;

(ඇ) ආලෝකය සහ වාතාශ්‍රය;

(ඈ) ගින්නෙන් ආරක්ෂාව;

(ඉ) පරිශ්‍රයෙහි සහ වහලෙහි ජලාපවහනය;

(ඊ) ඉදි කිරීමේ ද්‍රව්‍ය සහ භාවිත ක්‍රමය සඳහා පිරිවිතර;

(උ) ජල නල සවිකිරීම, කැලි කසළ ඉවත් කිරීම, විදුලි රැහැන් ඇදීම සහ කල විදුලි සෝපාන සවි කිරීම සඳහා ප්‍රමිති සහ ද්‍රව්‍ය;

(ඌ) විදුලි, දුරකථන, විදුලි සංදේශ සහ මයික්‍රෝවේව සහ වෙනත් රැහැන්වල සිට ගොඩනැගිලි දක්වා පැහැදිලි දුර පිළිබඳ විධිවිධාන;

(එ) අභ්‍යන්තර ගොඩනැගිලි සම්බන්ධයෙන් නියෝග සහ ගොඩනැගිලිවල ශක්තිය, ආරක්ෂාව සහ පහසුකම් තහවුරු කිරීම සඳහා ගොඩනැගිලිවල යෝග්‍යතාවය සහ ආනුෂංගික වෙනත් කරුණු සම්බන්ධයෙන් ප්‍රමිති නියම කිරීම

සඳහා නියම.

5. ගොඩනැගිලිවල වාස්තු විද්‍යාත්මක ලක්ෂණ, උස සහ ඉදිරිපස පිහිටුම පාලනය කිරීම සහ නාගරික සැලසුම් අරමුණු ඉටු කර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම.

6. කැලෑ ඉඩම් සහ ගස් ආරක්ෂා කිරීම සහ වගා කිරීම ද, දර්ශනීය ස්ථාන සහ [illegible] හෝ වාස්තු විද්‍යාත්මක වටිනාකමක් ඇති සහ රමණීය දර්ශනයකින් යුත් ස්ථාන ආරක්ෂා කිරීම ද ඇතුළුව භූමි දර්ශන රැක ගැනීම සහ නංවාලීම සඳහා විධිවිධාන සැලැස්වීම.

7. පරිසර දූෂණය, පරිසර ගුණය සහ දැන්වීම් පළ කිරීම පාලනය කිරීම.

8. මෝටර් රථ නතර කිරීම සඳහා ද සියලුම වර්ගවල වාහන නතර කිරීම, ඒවාට පැටවීම සහ ඒවායේ සේවා කිරීමේ ස්ථාන පිළිබඳව ද විධිවිධාන සැලැස්වීම.

9. (අ) පයින් ගමන් කරන්නන් සහ සයිකල් පදින්නන් සඳහා විශේෂ පහසුකම් ඇතුළත්ව වාහන සහ ගමන් පහසුකම්;

(ආ) ජල සැපයීම, කසළ බැහැර කිරීම සහ ජලාපවහනය හා කසළ ඉවත් කිරීමේ පහසුකම්;

(ඇ) විදුලි බලය සැපයීම;

(ඈ) විදුලි සංදේශ කටයුතු

පිළිබඳ වූ ද ඊට ආනුෂංගික වන්නා වූ ද කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම.

10. ප්‍රවේශ මං සහ පාරවල්, උද්‍යාන, ක්‍රීඩා භූමි සහ වෙනත් පහසුකම් සඳහා විවෘත ඉඩකඩ සඳහා අවම ප්‍රමිති ඇතුළත් ව, ගොඩනැගිලි කාර්ය සඳහා ඉඩම් පිරිසැලසුම් කිරීම සඳහා ද, පාරවල් තැනීම හෝ පාරවල් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ඉඩම් පිළිබඳව කොන්දේසි පැනවීම සඳහා ද විධිවිධාන සැලැස්වීම සහ එවැනි පහසුකම් සැලසීම හෝ එවැනි ඉදි කිරීම හෝ වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් වූ වියදමට දායක වීම.

11. ඉඩම් ගොඩ කිරීම සඳහා විධිවිධාන සැලසීම.

12. නිස්ව තිබෙන්නා වූ හෝ දැනට ම ඉදි කිරීම් කර ඇත්තා වූ ඉඩම්, ගොඩනැගිලි තැනීමේ භූමි භාග වශයෙන් පිරිසැලසුම් කිරීම සහ යළි පිරි සැලසුම් කිරීම.

13. පදු මාවත්, වීදි, කාරබූල් සහ විදුලි සංදේශ කටයුතු ඉදි කිරීම, හැරවීම, දීර්ඝ කිරීම, වෙනස් කිරීම හෝ වැඩි දියුණු කිරීම.

14. ගොඩනැගිලි, පාලම් සහ වෙනත් ඉදි කිරීම් තැනීම, වෙනස් කිරීම, ඉවත් කිරීම හෝ කඩා දැමීම.

15. ඉඩම්වල අක්‍රමිකාකාරයට පිහිටි භූමි කොටස්වල සීමා නැවත බෙද වෙන් කිරීම සහ නැවත පිහිටුවීම.

16. විශේෂ සැලකිල්ල දැක්වීම සඳහා ප්‍රදේශ බෙද වෙන් කිරීම සහ ඒවා විස්තර වශයෙන් සැලසුම් කිරීම, ආරක්ෂා කිරීම සහ ප්‍රති සංවර්ධනය කිරීම.

17. සංවර්ධන සැලැස්ම කරගෙන යා යුතු පියවරවල්.

18. විවිධ සංවර්ධන කාර්ය වෙනුවෙන් ගාස්තු සහ සේවා ගාස්තු අය කිරීම.".

ඇතැම් සංශෝධන අතීතයට බලපෑම.

11. මේ පනතේ 4 වන වගන්තිය මගින් සහ 5 වන වගන්තියේ (ආ) සහ (ඇ) ඡේද මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන 1978 ඔක්තෝබර් මස 01 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

පළාත් පාලන ආයතන නිලධරයන් විසින් නීත්‍යනුකූල අවසරයක් නොමැතිව කරන ලද ඇතැම් ක්‍රියා බලාත්මක කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය යටතේ සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශිත යම් ප්‍රදේශයක් ඇතුළත සැලසුම් කිරීමට අදාළ යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාවේ යෙදවීමේ, ඉටු කිරීමේ හෝ කිරීමේ ලා පළාත් පාලන ආයතනයක නිලධරයකු විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව යම් ක්‍රියාවක් කරනු ලැබ ඇති අවස්ථාවක, එම බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාවේ යෙදවීමට, කිරීමට හෝ ඉටු කිරීමට ඒ නිලධරයාට නීත්‍යනුකූලව බලය පවරා නොතිබීමේ හේතුව නිසා පමණක් ඒ ක්‍රියාව අවලංගු ලෙස සලකනු නොලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා, පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.